# Living the Lotus

## Buddhism in Everyday Life



3
2021
VOL. 186

*Founder's Reflections*

## දුක් කරදර පවා ආශිර්වාදයකි

යම් කරදරයක් ඇති වු විට, ‘අයියෝ, ප්‍රශ්න ඉවරයක්’ නැහැ ලෙසින් පුරුද්දට කියන අය සිටියි. නමුත් නිතරම පවසන පරිදි, මම නම් කොපමණ අසීරු ප්‍රශ්න පැමිණියත් ‘දැන්නම් ප්‍රබෝධයක් දැනෙනවා’ ලෙසින් මටම කියා ගන්නවා. එහිඇති කෙස් ගසක තරම් වු වෙනස ඉතාමත් වැදගත්ය.

අපි ප්‍රශ්න වලට මුහුණදීම අසීරු යැයි හැගෙන විට, පසුබසිනවා. නමුත් මම ඊට හාත්පසින්ම වෙනස්ව ‘මෙයින් කොහොමහරි ගොඩ එනවා’ සේ හදවත දැඩිකරගෙන, ඉක්මණින් සිදුකල යුතු දේ ක්‍රියාව නගනවා. එසේ ක්‍රියාවට නැගීම තුලින්, අනිවාර්යයෙන්ම නව මාවතක් විවෘත වනවාසේම, එයින් ආත්ම ශක්තියද වැඩිවෙනවා.

අප සංවිධානයේ සංවත්සරය සමරන මෙම මාසයේ මතකයට නැගෙන්නේ, මගේ ගුරුපියා වන සුකෙනොබු අරයි මහතාගෙන් ‘බුදු දහම යනු දුක නැති කිරීමේ මාර්ගයයි’ සේ ඉගෙන ගෙන, ‘ඕනෑම දුකක් නැතිකර ගත හැකි ඉගෙන්වීමක් මට හමුවුනා’ යනුවෙන් සතුටින් උඩපනිමින් ඒ කාලයේ ගත කල හැගීමයි. එම දුක නැති කිරීමේ මාර්ගයේ ප්‍රධාන සාධකය වන්නේ, තමාට අවාසියක් වන දේ හෝ ඇති වන ප්‍රශ්න ගැටළු හැම දෙයක්ම බුදුන් වහන්සේගේ ආශිර්වාදයන් සේ යහපත් ආකාරයට පිලිගැනිමයි.

එම සිතුවිල්ලෙන් මම හැමදෙයක්ම භාරගෙන කටයුතු කලා. එසේ කිරීමට නොහැකිනම් නියම බෞද්ධයෙක් බව පැවසිය නොහැකි යැයි සිතමි. සංවිධානයේ ජ්‍යේෂ්ඨ නායකයින්ද එම කරුණ හොදින්ම හදවතට බද්ධ කර තබාගත යුතුය.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 26-27

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus
Vol. 186 (March 2021)

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editors: P.A.D. Somapala, Ruklanthi Palipana, Sahan Chamara

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp



*President’s Message*

# විශ්වාසයෙන් යම්දෙයක් භාරදිය හැකි හදවත

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## බුදුන්ගේ දුෂ්ඨි කෝණයෙන් බැලීම

'වෙනස්වීම, රැගෙන එයි සිනහාවක්, කඳුළුත් සමගින්', යනුවෙන් සෙයිරා මත්සුඔකා මහතාගේ ප්‍රසිද්ධ කවියක් තිබේ. මෙහිදී වෙනස්වීම යනුවෙන් සඳහන් කර ඇත්තේ, ආයතන වල සිදුවන පුද්ගලය මාරුවීම්ය. එවැනි මාරුවීම් වලදී දුක හා සතුට ඇතිවීම ජපානයේ එදෝ යුගයේත් අදත් වෙනසක් නොමැත.

වසන්ත කාලය උදාවෙත්ම, නොයෙකුත් ආයතන වල ප්‍රධාන මාතෘකාව බවට පත්වන්නේ පුද්ගල මාරුවීම්ය. අප සංවිධානයේද කාලය පරිච්ඡේදය වෙනස් වුවත් පුද්ගලය මාරුවීම් සිදුවේ. අප ආයතනයේද එවැනි මාරුවීම් තීරණය කරන්නේ අනෙකුත් ආයතන තිබෙනවා වාගේම කමිටුවක් විසින්ය. මන්ද තනි පුද්ගලයෙක්, උදාහරණයක් ලෙස මම තනිවම පුද්ගල මාරුවීම් තිරණය කරණවා නම්, මගේ පෞද්ගලික හැඟීම් එම තීරණ වලට ඇතුළුවිය හැකි නිසාය.

අපි සැවොම සාමාන්‍ය හදවතකින් යුතු සාමාන්‍ය පුද්ගලයන් වේ. එමනිසා කැමැත්ත හෝ අකැමැත්ත මත දෝලනය වෙමින්, කටකතා හා පක්ෂපාතී බව මත ලේබල් අලවමින්, පුද්ගලයන්ගේ තත්වය තීරණය කරයි. එයින් බුදුන්ගේ දුෂ්ඨි කෝණයෙන් පුද්ගලයන් දෙස බැලීමක් සිදු නොවේ. 'සැමදෙනා බුද්ධ ස්වභාවයෙන් යුතුවේ', ලෙසින් සියළුම සත්වයන්ම බුද්ධ ශක්තියෙන් යුතු බව ඉගෙන ගත්තත්, සාමාන්‍ය මනුෂ්‍ය දුෂ්ඨි කෝණයෙන් නිතරම බලන්නේ අපගේ භක්තිය ඉහළ තලයට ලඟාවී නොමැති නිසාය.

එසේම, පුද්ගලයන්ට කුමන හෝ ලේබල් අලවා නම් පටබ්දිනවා නම්, ඒ හා සමානම ගතිලක්ෂණයන් තමා තුලත් තිබෙන බව පසුවිපරම් කිරිම වැදගත්ය. උදාහරණයක් ලෙස යම් කෙනෙකුව 'නිවටයෙක්' සේ පෙනෙන්නේ නම්, තමා තුලද නිවටකමක් තිබෙන බවය.

සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ 'පවරා දීම' යන 22 පරිච්ඡේදයේදී, 'සියළුදෙනාගේම සතුට වෙනුවෙන් මෙම සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය දේශනා කරන්න ඔබලාට භාරදෙමි' ලෙසින් බුදුන් වහන්සේ විසින් බෝධිසත්වයන් වහන්සේලාට පවරාදුන්හ. එසේ බුදුන් වහන්සේ විසින් බෝධිසත්වයන් වහන්සේලාව විශ්වාස කලා මෙන්, අපිත් සෑම අවස්ථාවකදීම අන්‍යයන්ව විශ්වාස කරන්නෙ නම්, හදවතට කොපමණ සැහැල්ලුවක් ලැබේවිද. එසේ විශ්වාසයෙන් භාරදෙන බුදුන් වහන්සේ වාගේ, අන්‍යයන් දෙස බලන්නටත්, විශ්වාස කරන්නටත් හැකිනම් ඉමහත් වු ආනිශංස ලබා ගැනීමට හැකිවේ.

# බුදුන් වහන්සේගේ පවරාදීම හා රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය ස්ථාපිත කිරීමේ අරමුණ

වයසක පුද්ගලයන්ව රවටා මුදල් කොල්ලකමින් අපරාධ සිදු කරන මෙම කාලවකවානුවේ, 'සෑම දෙනාම බුද්ධ ස්වභාවයෙන් යුතු නිසා' යනුවෙන්, කිසිවෙකුව විශ්වාස කිරීමට නොහැකියි. නමුත් අවම වශයෙන් 'තමන්' බොරු කීමෙන් හා අපහාස කිරීමෙන් වැළකී, අන්‍යයන් සමඟින් විශ්වාසය ගොඩනඟා ගනිමු.

ජපන් භාෂාවෙන් විශ්වාසය (信) යන රූපාක්ෂරය හැදී තිබෙන්නේ 'පුද්ගලයා' (人) හා 'වදන' (言) යන අකුරු දෙකේ එකතුවකිනි. මනුෂ්‍යයන් පවසන වදන් තුලින් ඔවුන්ගේ හදවතේ ස්වරූපය දිස්වන නිසා, 'අව්‍යාජ බව' ද එයින් අරුත් ගන්වන බවයි මම ඉගෙන ගෙන තිබෙන්නේ. එසේම 'වදන' තුලින් 'ජීවය' ද සංකේතවත් කරන නිසා, 'මේ විශ්වය, දෙවියන් හා බුදුන්ගේ ජීවයන් වදන් තුලින් පෙන්නුම් කරයි' ලෙස පවසන අතරම, ඒ ආකාරයට එකිනෙකා අතර වදන් හුවමාරු කර ගන්නේ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා විශ්වාස කරන නිසාය.

එසේම, අන්‍යයන්ව විශ්වාස කිරිමට හා අන්‍යයන්ගේ විශ්වාසය දිනා ගැනිමට හැකි වැදගත්ම කරුණ වන්නේ,  තමන් අවංක භාවයෙන් යුතුව අන්‍යයන් සමඟ කතාබහ කිරීමයි. එය සාමාන්‍ය කරුණක් සේ පෙනුනත්, අපට පහසුවෙන් එය සිදුකිරිමටද නොහැකි යැයි සිතෙයි.

විශ්වාසයෙන් යම්දෙයක් භාර දීම ගැන පවසන විට, අපි දිනපතා 'නමු මියෝ හෝරෙන්ගේ ක්යෝ' ලෙසින් ඔදයිමොකු සජ්ජායනා කිරීමේදී, 'සෑම සියළු සත්වයෙකුම බුදු කෙනෙකු බවට පත්වී, සතුට උදාකර ගැනීම විශ්වාස කරමින්, දෙවියන් හා බුදුන්ගේ ආශීර්වාදයට විශ්වාසයෙන් සෑම දෙයක්ම භාරදෙමි' ලෙසින් අධිෂ්ඨානය කරයි. ජෝදෝ නම් ආගමික නියායේ ජිත්සුඔ ෆුජි හිමියන් විසින් 'සෑම දෙයක්ම භාරදිය හැකි ශරීරය, සන්සුන් හා ශක්තිමත් වේ. එබැවින් අද දිනයේදීත් අමිතා බුදුන් සමඟින්, දීප්තිමත්ව ජිවිතය ගත කරමු' සේ පවසයි. අප සංවිධානයේ ඔදයිමොකු වල අරුථට මෙම ෆුජි හිමියන්ගේ වදන එකට බද්ධ කළ විට, ඕනෑම යුගයක හා ඕනෑම පරිසරයක 'දිප්තිමත්ව ජිවිතය ගත කිරිමු' යන දැඩි ආත්මීය ශක්තියක් උද්දීපනයවනවා නොවේද.

එමෙන්ම අප සංවිධානය ආරම්භ කළදින පටන්ම, 'නව සාමාජිකයන් ධර්ම ව්‍යාප්තිකයන් වීම' කොන්දේසියන් බවට පත්ව තිබුනා. එයද සෑමදෙනාගේම සතුට ප්‍රාර්ථනා කරන බුදුන් වහන්සේ විසින් පැවරූ රාජකාරියක් වෙනවා සේම, සාමාජිකයන් නිසා බියක් ඇතිකර නොගත යුතුය යන නිර්මාතෘ තුමාගේ විශ්වාසයද වේ. ඒ නිසා ප්‍රථමයෙන්, ධනාත්මක හදවතක් ඇතිකර ගෙන, දෙවියන් බුදුන් හා මිනිසුන් තුල පුළුල් බැදීමක් ඇතිවන ආකාරයට 'විශ්වාසය' ගොඩනඟා ගනිමු.

From *Kosei*, March 2021.

# කෘතවේදීත්වයේ හදවත වැදගත්ව සලකා ජීවිතය ගත කිරීම
## ~ ගකුරින් පාසලේ වසර දෙකක අධ්‍යාපනය තුලින් මම ඉගෙනගත් දෙය වේ ~

කස්තුරි ආරච්චිගේ රජිත මධුරංග ශ්‍රියානන්ද මහතා
රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ශ්‍රී ලංකා ශාඛාව

මම ශ්‍රී ලංකා ධර්ම මන්දිරයේ රජිත මධුරංග වෙමි. 1992 වර්ෂයේ 11 වන මස 27 වන දී ශ්‍රී ලංකාවේ පොළොන්නරුව ප්‍රදේශයේ කස්තුරි ආරච්චිලාගේ යන පවුලේ වැඩිමහල් පුතා උපත ලැබුවා. දෙමාපිය යුවල සහ බාල සහෝදරයින් දෙදෙනෙක් සිටින මාගේ පවුල මාත් සමග සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත පවුලකි. උපත ලබා අවුරුදු 02ක් දෙමාපියන් ලඟ හැදුන නමුත් අවුරුදු 02න් පසුව මාගේ නැන්දගේ නිවසේ හැදී වැඩුණා. මාගේ පියා යුද හමුදවේ සේවය කරමින් සිටියදී ලැබුණ ස්ථාන මාරුවත් සමග, එකල රටෙහි පැවති ත්‍ර ස්තවාදී තර්ජන නිසාත් මාගේ ආරක්ෂාව ගැන සිතා දෙමාපියන් මාව නැන්දට භාර දී තිබුණා. ඉන් පසුව වයස අවුරුදු 2 සිට අවුරුදු 16 වන තෙක් නැන්දගේ නිවසේ හැදී වැඩුණා.

පසු කාලයේ තවත් සහෝදරයින් දෙදෙනෙක් පවුලට එකතු වුණා. මාගේ වයස අවුරුදු 16 වන විට මගේම දෙමාපියන් සමග ජීවත් වීමට පටන් ගෙන සතුටින් කාලය ගත කලා. නමුත් අවුරුදු 18 වන විට මාගේ උසස් පෙළ විභාහගෙය පැවති කාලයේ හදිසියේම මාගේ මව අපගේ පවුල අත් හැර ගියා. පසුව මාගේ විභාගයෙන් පසුව පියාත් සමග මව සොයමින් හැමතැනම ගියා. දවසක් අම්මව හමුවෙලා නිවසට රැගෙන ඇවිත් නැවත අපි එකට ජීවත් වෙමු කියලා ගොඩක් කතා කලා. නමුත් ඒ වෙලාවේ ඇයගේ පිළිතුර වුණේ එකට ජීවත් වීමට අකමැතියි කියාය. එක් දවසක් පොලීසියටද ගියා නමුත් මව අකමැති වූ නිසා මම සහ සහෝදරයින් දෙදෙනා පියා සමග ජීවත් වීමට පටන් ගත්තා.

මව නැති පාළුව දැනුනත් ධර්ම මන්දිරයට පැමිණි විට එය නැතිවී ගියා. ධර්ම මන්දිරයට පැමිණ තරුණ කණ්ඩායම් සමග සිටින විට දුක නැතිවී සතුටක් දැණුනා. කුඩා කාලයේ නැන්ද සමග ධර්ම මන්දිරයට පැමිණ තිබුනත් කෝසෙයි කායි කියන්නේ මොනවගේ තැනක්ද කියලා තේරුමක් තිබුණේ නැහැ. කෝසෙයි කායි සාමාජිකයන් ඕතසුකියක් සහ ඕජොත්සුවක් රැගෙන කියවමින් සිටින ආකාරය ගැන පමණි හිතුවේ. නමුත් විනෝදකාමී තැනක් වුණා. කාලයත් සමග කෝසෙයි කායි ඉගැන්වීම් ඉගෙන ගැනීමට ලැබුණා. තරුණ සම්මන්ත්‍රණ වලට සහාභාගී වුනා. හෝස තිබුණා, ඒ දේවල් විනෝදකාමී වුණ නිසාත් හදවත සැහැල්ලු කරන නිසාත් ධර්ම ශාකාවට යෑමට සිතුණා. ඒත් සමග කෝසෙයි කායි එක හොද තැනක් කියලා දැණුනා. තවත් දේවල් ඉගෙන ගන්න ඕන කියන අදහසක් ඇති වුණා.

පාසැල් අධ්‍යාපනය අවසන් වී ජර්මන් ටෙක් එකේ පාඨමාලාවක් කිරීමට ආරම්භ කල නිසා ධර්ම ශාකාව කිට්ටුව මම කුළියට නැවතුණා. සතියේ දිනවල කාර්මික විදයාලයට යන අතරතුර නිවාඩු දින වල සෙනසුරාද ඉරිද දින වල ධර්ම ශාකාවට පැමිණියා. ඒ කාලයේ ගකුරින් ගොස් අධ්‍යාපනය ලබා පැමිණි සිටි ශ්‍රේෂ්ඨයින් දැක මටත් එලෙස ගොස් අධ්‍යාපනය ලැබීමට තුබුණානම් කියලා ආසාවක් තිබුණා. ඒ විදියට ආසාවෙන් ඉන්න කොට යමමෝතෝ කියෝකයිචෝ සාන්ගෙන් මට අවස්ථාවක් ලැබුණා ගකුරින් අධ්‍යාපනය පිටත් වීමට තීරණය කලා.

ජපානයට ගොස් ජපන් භාෂාව කතා කිරීමට නොහැකි නිසා ගොඩක් අපහසු වුණා. නමුත් ගකුරින් එකේ ගුරුවරුන් සහ ජේෂ්ඨ සිසුන්ගේ උදව්වෙන් ගකුරින් හි ජීවිතයට ටික ටික හුරුවුණා.

මම ගකුරින් අධ්‍යාපනය ලබන කාලය තුලදී අකිතා ධර්ම ශාකාවේ පුහුණුව ලබන කාලයේ සිදු වූ සිදුවීමක් පිළිබදව කතා කිරීමට කැමතී. දවසක් හවස 6 ට සිදු කරන ගොකුයෝ එකෙන් පසුව එක් සාමජිකයෙක් මාත් සමග කතා කලා. මම ඒ පුද්ගලයාව 'A' සාන් කියලා සදහන් කරන්නම්. ඒ වෙලාවේ 'A' සාන් පැවසුවේ මාව දැකලා එයාගේ බඩේදීම නැති වුණ ළමයා ගැන මතක් වුණා කියලා. පසුව මම කල්පනා කරලා ඇයි එවැනි දුක් සහගත දෙයක් අහන්න ලැබුණේ කියලා. පසුදින උදෑසන අකිතා ධර්ම ශාකාවේ තකහෂි කියෝකයිචෝ



*පවුල් හෝසාවකට සහභාගී වී සිටින රජිත මධුරංග (මැද) මහතා*

සාන්ට ඒ පිළිබඳව කීව විට ලැබුණු පිළිතුර වූවේ, ඒ ගැන වැඩි දුර 'A' සාන් සමග කතා කරන්න කියලා. පසුව මම 'A' සාන් සමග කතා කලා.එවිට ඇය පැවසුවේ නැතිවූ බබා හොඳින් ඉපදුනානම්, අද වනවිට අවුරුදු 26 ක් වන බවත්, මේ දක්වා අමතක වුණ එක දවසක්වත් නැහැ. හැමදම මතක් වෙනවා වගේම කඳුළු එනවා කියාය.

ඉතින් මම හිතුවා 'A' නැතිවුණ ළමයා ගැනත් වැදගත්ව සිතමින් ඉන්නවා, නමුත් මගේ මව එසේ නොමැතිව අපිව අයින් කරලා පවුලෙන් ඈත්වෙලා ගියානේ කියලා තමා මම හිතුවේ. ඒ නිසා අම්මා ගැන වයිරයක් තිබුණා. නමුත් ටිකක් ගැඹුරින් කල්පනා කරලා බලපු කාලයේ මාව බලන්න ඇවිත් ආසකරන දේවල් අරන් දීලා මාව සතුටින් තිබ්බා නේද කියලා මතකයට ආවා. මාව අනතුරකට ලක්වෙලා රෝහලේ ප්‍රතිකාර ලබන විටත් මාලගින් ම සිටියා නේද කියලා මතකයට ආවා. ඒ වගේම මමත් මල්ලිලා දෙන්නත් ලොකු වෙනතෙක් හොඳින් බලාගත්තා නේමද, ඒ කාලේ හොඳින් සතුටින් හිටියා නේද කියලා මතක් වුනා. ඉතින් මම අද ඉන්නේ මගේ මල්ලිලා දෙන්න ඉන්නේ අම්මා නිසා නේද කියල හිතලා අම්මා අපිට උපත දීපු එක ගැන ස්තුතිවන්ත හදවතක් ඇති වුණා. ඒ වෙලාවේ පළවෙනි වතාවට අම්මා ගැන හොයලා බලන්න ඕන කියල සිහියට නැගුනා.

ඒ විදිහට ධර්ම ශාකාවේදී ලබපු පුහුණුවේ උපකාරයෙන් ආත්මාර්ථකාමී හදවත ඉවත් කරලා අන් අය ගැන වැඩිපුර හිතන්න පුලුවන් වුණා.

ඉතින් අම්මා ගැන තිබුනු වෛරී හදවත වෙනස් වීමත් සමග නිතරම පාහේ තරහගත් මම පොඩ්ඩක් කරුණාවන්ත හදවතක් ඇති කරගන්න පුලුවන් වුනා. කලින් සිටම මම අන් අයට උපකාර කිරීමට කැමැත්තක් දැක්වූවා වුනත් මෙතැන් සිට තවතවත් අන් අයව සතුටු කල හැකි ආකාරයේ වැඩ කටයුතු සිදු කල යුතුයි කියන ඒ හැගීමක් ඇති වුණා.

ගිය අවුරුද්දේ 3 වන මාස ගකුරින් අධ්‍යාපනය අවසන් කර මම ශ්‍රී ලංකාවට නැවත පැමිණියා. කොරෝනා තිබුන නිසා ලංකාවට පැමිණි විගස අම්මව හමුවීමට අපහසු වූවත් දුරකථනයෙන් කථාකල විට ඇය ගොඩාක් සතුටට පත් වුණා. ඉතින් කොරෝනා අවධානම ටිකක් අඩුවුණාට පසුව 7 වන මාසයේදී අවුරුදු 2 හමාරකට පසුව මම අම්මව බැලීමට ගියා. හුග කලකට පසුව සතුටු වුණා වගේම අපි ගොඩාක් දේවල් කතාබහ කලා. ඒ වගේම දෙදෙනා තුළ තිබුණු වැරදි වැටහීම් තේරුම් ගැනීමට පුළුවන් වුණා. ඉතින් ඒ විදියට මම අම්මත් තාත්තත් සමග හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන සිටිනවා. කවදහරි දවසක දෙමාපියන් දෙදෙනාත් වැරදි තේරුම් ගෙන නැවත එකතු වේවි කියාන විශ්වාසයෙන් තමයි මම දැන් ජීවත් වෙන්නේ. මේ විදියට අම්මා ගැන තිබුණු වෛරී හදවත වෙනස් වීමත් සමග හමුවන සෑම පුද්ගලයෙකුටම, සෑම දෙයකටම බොහොම ස්තුතියි කියල කියන්න පුළුවන් තැනට මම පත් වුණා.

ගිය අවුරුද්දේ කොරෝනා තිබුණ නිසා තාත්තාත් මල්ලිලා දෙදෙනාත් සමග මාස 3 ක කාලයක් එකට ඉන්න පුළුවන් වුණා. ඉතින් කොරෝනා අවධානම අඩු වීමත් සමග 7 වන මාසයේ සිට මම ධර්ම මන්දිරයේ නතර වෙලා වැඩ කටයුතු කරමින් ඉන්නවා.

ගකුරින් අධ්‍යාපනයෙන් මා ලබාගත් වැදගත්ම කරුණක් වන්නේ ආදීමුතුන් මිත්තන්ට ස්තුති පූර්වක හදවතක් ඇති කරගැනීමයි. අපි මේ විදියට ඉපදී තිබීමට හේතුව අපගේ ආදීමුතුන් මිත්තන් වේ. එම නිසා එම කාරනය අන් අයටද පහදා දීම, ආදීමුතුන් මිත්තන් වෙනුවෙන් ගොකුයෝ කිරීම, පිං අනුමෝදන් කිරීම, ස්තුති පූර්වක වීම යන කරුණු වල වැදගත් කම පහදා දීමට අවශ්‍යයි.

ඒ වගේම මේ ලෝකය තුළ උපත ලබා හොඳින් හදවඩා ගැනීම නිසා අප ලගින්ම සිටින දෙමාපියන්ට ස්තුති පූර්වක වීම වැදගත් කාරණයක් වනවා. දෙමාපියන්ට ස්තුති පූර්වක වීමේ වැදගත්කම අන් අය සමගත් බෙදගත යුතුයි කියල මම හිතන් ඉන්නවා. ඉතින් මම අවුරුදු 2 ක් ගකුරින් හි ලබපු අත්දැකීම් තුළින් මා ඉගෙනගත් දේ හැමෝම සමග බෙදගෙන, අන් අයව සතුටට පත් කරන පුද්ගලයෙකු වීමට මම පොරොන්දු වෙනවා. දානමය ක්‍රියාවක් සිදු කිරීමේ වැදගත්කම සහ එයින් ලැබෙන ආනිසංස සහ සිතට දැනෙන සතුට විදීමට සලසන්න ඕන කියල හිතනව.

අවසාන වශයෙන්, මේ අවුරුද්දේ 4 වන මස විවාහ වීමට තීරණය කර තිබෙනවා. මේ ඉගෙනගත් දේවල් අලුත් පවුල තුළ ප්‍රායෝගිකව පුහුණු කරනවා.

ආදීමුතුන් මිත්තන්ට සහ දෙමාපියන්ටත් මේ මොහොත දක්වා ජීවත් වීමට උපකාර කල සෑම දෙනාටම හදවතින්ම ස්තුති පූර්වක වෙමින්, අන් අයව සතුටට පත් කරන පුද්ගලයෙකු වීමට පොරොන්දු වෙනවා.

බොහොම ස්තුතියි.



*ගකුරින් පාසලේ ශිෂ්‍යයන් හා ගුරුවරුන් සමඟ සිටින රජිත මහතා*

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ
## සාරාංශය හා වැදගත් කරුණු

කර්තෘ: නික්යෝ නිවානෝ

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 24 වන පරිච්ඡේදය, ගද්ගද ස්වර (මහා හඬ ඇති) බෝධිසත්වයන්



### ගද්ගද ස්වර බෝධිසත්වයන් සහලෝකය වෙත පැමිණීම

භෛෂ ජ්‍යරාජ බෝධිසත්වයන්ගේ පෙර භවය වන 23 වන පරිච්ඡේදයේ ධර්ම දේශනාව අවසන් කළ බුදුන් වහන්සේ, හිසේ තිබෙන ශුභ්‍ර වර්ණ ඌර්ණ රෝම ධාතුවෙන් රශ්මි කදම්භයක් (ප්‍රඥුවේ ආලෝකයක්) විහිදු වූහ.

එවිට, නැගෙනහිර දිශාවේ පිහිටි වෛරෝචන රශ්මි ප්‍රතිමණ්ඩිතා නම් ලෝක ධාතුවේ කමලදල විමල සංකුසුමිතාභිඥ නම් බුදුන් කෙනෙක් හා ශ්‍රාවකයෙකු වන ගද්ගද ස්වර නම් විශිෂ්ට බෝධිසත්වයන් වහන්සේ කෙනෙක්ද සිටින බව දැකිමට හැකිවිය.

එවිට එම බෝධිසත්වයන් වහන්සේ විසින් බුදුන් වහන්සේ අමතා 'මම සහලෝකයට ගොස් ශාක්‍යමුණි බුදුන් වහන්සේට වන්දනා පූජෝපහාර කර, අනෙකුත් බෝධිසත්වයන් වහන්සේලාව බැහැ දැකීමට කැමතියි' සේ ප්‍රකාශ කලහ. එවිට බුදුන් වහන්සේ විසින්, 'යහපති, ගිහින් පැමිණෙන්න. නමුත් මෙම රාජ්‍යට වඩා සහලෝකය ඉතා අපිරිසිදුය, දුර්ගන්ධයෙන් පිරී තැනකි. එහි වැඩ සිටින බුදුරජාණන් වහන්සේගේ ශරීරය ඉතා කුඩාය. බෝධිසත්වයද එසේම කුඩාය. එහෙත් පහත් කොට නොසලකන්න' යැයි වදාළහ. මන්ද, කමලදල විමල සංකුසුමිතාභිඥ බුදුන් වහන්සේගේ ශරීරය යොදුන් හැට අට ලක්ෂයක් උසින් යුතුය, ගද්ගද ස්වර බෝධිසත්වයන් වහන්සේගේ ශරීරය යොදුන් හතළිස් දෙදහසක් උසින් යුතුය, ශරීරය රන්වන් පැහැයෙන් දිස්වන නිසා සහලෝකයේ බුදුන් හෝ බෝධිසත්වයන් වහන්සේලා සමඟ සංසන්දය කිරීමටවත් නොහැකිය.

ඉන්පසු එම අලංකාර ශරීරයෙන් හා විශිෂ්ටබවින් යුතු ගද් ගදස්වර බෝධිසත්වයන් වහන්සේ සහලෝකයේ ගිජ්ජකූට පර්වතයට ළඟා වී, බුදුන් වහන්සේට වැඳ නමස්කාර කළහ. තවද 'ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේවද බැහැදැකීමට කැමයි' ලෙසින් ප්‍රකාශ කල විට, බුදුන් වහන්සේ එය ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේට එය දැන්වූහ. 'මම බුදුන් වහන්සේට වන්දනා මාන කිරීමට පැමිණියෙමි' ලෙසින් පවසමින් පැමිණි ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේගේ වදන් දෝංකාර දුන්හ.

මෙම සිදුවීමෙන් පුදුමයට පත්ව සිටි පද්ම ශ්‍රී බෝධිසත්වයන් වහන්සේ ඒ ගැන බුදුන් වහන්සේගෙන් විමසා සිටියහ. එවිට බුදුන් වහන්සේ විසින්, ගද් ගදස්වර බෝධිසත්වයන් වහන්සේ අතීතයේ මේඝදුන් දුභිස්වරරාජ නම් බුදුන් වහන්සේට අවුරුදු 1200 ක කාලයක් සංගීත භාණ්ඩ වාදනය කර පූජෝපහාර පවත්වා, 84000 ක රන් පාත්‍රද පූජා කිරීමෙන් මෙසේ ශ්‍රේෂ්ඨ වූ බව පැවසූහ. එසේම ගද් ගදස්වර බෝධිසත්වයන් වහන්සේ මෙම ශරීරයට පමණක් සීමා නොවී, නොයෙකුත් ස්වරූපයන් තුලින් සියළු ලෝ වැසියන්ට ධර්මය දේශනා කරයි සේ වදාළහ.


එම කථාව අසා සිටි, ගද් ගදස්වර බෝධිසත්වයන් වහන්සේ තමා සහලෝකයට පැමිණි කර්තව්‍යය සාර්ථක වූ බැවින් නැවත තමාගේ මුල් ලෝකයට වැඩම කලහ.



මෙම පරිච්ඡේදයේ සාරාංශය මෙපමණයි. මෙහි සඳහන් වෛරෝචන රශ්මි ප්‍රතිමණ්ඩිතා නම් ලෝක ධාතුව 'කල්පිත ලෝකයක්' වේ. කල්පිත යනු, හදවතින් මවාගන්නා ස්වරූපය නිසා, ඒ ලෝකය තුල රන්වන් පැහැයෙන් දිස්වන බුදුන් හා බෝධිසත්වයන් වහන්සේලාගේ ස්වරූපය ඉතා විශාල වන අතර, සහලෝකයේ දැකිය නොහැකි ආකාරයෙන් අලංකාරයෙන් යුතුවේ. යථාර්තවාදී ලෝකය (සහලෝකය) හා කල්පිත ලෝකය සමඟ සංසන්දනය කරන විට, සහලෝකය ඉතා අපිරිසිදු බවින් යුතුවනවා සේම, බුදුන් හා බෝධිසත්වයන් වහන්සේලා ඉතා කුඩාවට පෙනෙයි.

## කල්පිතය යථාර්තයක් බවට පත්කිරිමට උත්සහ ගැනීම

එහිදී, කමල දල විමල නක්ෂත්‍ර රාජ සංකුසුම්තාභිඥ බුදුන් වහන්සේ සමඟ තිබූ සාකච්ඡාවට අනුව ගද් ගදස්වර බෝධිසත්වයන් වහන්සේ විසින් සහලෝකයේ ශාඛ්‍යමුණි බුදුන් වහන්සේ බැහැදැක වන්දනාමාන කලහ. එහි අරුථ නම්, කල්පිත ලෝකය යථාර්තයක් බවට පත්කර මෙම සහලෝකය තුල ගොඩනැගීමට උත්සහ කරන බුදුන් වහන්සේ ඉතා විශිෂ්ට කෙනෙකි. කල්පිතයන් හදවතින් පමණක් මවාගැනිම සිදු කරන්නෙ නම්, එය හැමදටම සිහිනයක් බවට පත්වේ. එසේ නොමැතිව එය යථාර්තයක් බවට පත්කර ගැනීමෙන් හෝ එසේ කිරිමට උත්සහ කිරිමෙන් පමණක් එහි වටිනාකම ඇතිවේ. මෙම පරිච්ඡේදයේ ඇති පළමුවැනි වැදගත් කරුණ මෙය වේ.



## සද්ධර්මය සියළුම සත්වයන්ට දේශනා කිරිම



ඈත අතීතයේ ගද් ගදස්වර බෝධිසත්වයන් වහන්සේ ඉතා දිර්ඝ කාලයක් බුදුන් වහන්සේට සංගීත භාණ්ඩ වාදනය කර පූජෝපහාර පවත්වා, 84000 ක රන් පාත්‍රද පූජා කලහ. එහි අරුථ වන්නේ, 'සද්ධර්මය' මනුෂ්‍යයන්ගේ හදවතට කාවැදීමට සැලැස්වීමයි. 84000 ක පාත්‍ර පූජාව අරුත් ගැන්වෙන්නේ, බුදුන් වහන්සේගේ අසීමිත වූ ධර්මය සියළු වැසියන්ට දේශනා කල බවයි. 'බුදුන් වහන්සේ දේශනා කල සද් ධර්මය ලෝ වැසියන්ට දේශනා කිරීම', බුදු වහන්සේට කළ හැකි උපරිම පුද පූජාව වන බව මෙහි පෙන්වා දෙයි. මෙම පරිච්ඡේදයේ ඇති දෙවෙනි වැදගත් කරුණ මෙය වේ.

## අපිද ගද් ගදස්වර බෝධිසත්වයන් බවට පත්වෙමු

ගද් ගදස්වර බෝධිසත්වයන් වහන්සේ තම සෘද්ධි ප්‍රාතිහාර්යය තුලින් නොයෙකුත් ස්වරූප මවමින්, විවිධ ප්‍රදේශ වල ධර්මය දේශනා කළ හේතුව ඉහත කරුණෙන් පැහැදිලි වේ. අපි අවටද ගද් ගදස්වර බෝධිසත්වයන් වහන්සේලා විශාල ප්‍රමාණයක් සිටියි. එසේම, අපිද සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන ධර්මය දේශනා කරන්නේ නම්, ගද් ගදස්වර බෝධිසත්වයන් වහන්සේ කෙනෙක් බවට පත්වුනා වේ. එය හොඳින් හදවතට බද්ධ කර ගන්නේ නම්, ධර්මය ප්‍රචලිත කිරීම සඳහා ධෛර්යයෙන් යුතුව ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගත යුතුය. මෙම පරිච්ඡේදයේ ඇති තෙවෙනි වැදගත් කරුණ මෙය වේ.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』 ග්‍රන්ථය ඇසුරෙනි

කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P204-P208





# Director's Column

## මිල කළ නොහැකි ආශිර්වාදය

අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෙයිචි අකගාවා මහතා

මේ වසරේදීත් අප සංවිධානයේ සංවත්සරය සමරන මාසය උදාවුනා. පසුගිය වසරේදීත් සංවත්සර උත්සවය සැමරීමට නොහැකි වූ නිසා, හිතට ලොකු දුකක් ඇතිවුන බව හොඳින්ම මතකයි.

මේ වසරේ සමරන 83 වන සංවත්සරයද කොරෝනා ව්‍යසනය හොඳින්ම පාලනය නොවන්නේ නම්, අන්තර්ජාලය හරහා පැවැත්වේ යැයි අපේක්ෂා කරමි. හදවතින්ම සංවත්සරයට සුභ පතන අතරම, සිනහාවෙන් හා සතුටින් එම දිනය පිළිගැනීමට හැකිවේවා යැයි ප්‍රාර්ථනා කරමි. එමෙන්ම කොරෝනා ආසාදනය නොවන අයුරින් උපරිම ආරක්ෂිත පියවර අනුගමනය කරමින්, 'සිටිනා සෑම තැනක්ම ධර්මය පුහුණුවන ස්ථානය' බවට පත්කරගමින් ධර්ම පුහුණුවේ නොකඩවා යෙදීමට සිතමි.


සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල, බුදුන් වහන්සේ විසින් 'සාමාන්‍ය මනුෂ්‍ය හදවතක්' තිබෙන අපව විශ්වාස කර ධර්මය ප්‍රචලිත කිරීමේ වගකීම භාරදුනි. නමුත් කොරෝනා ව්‍යසනය අතරමැද අපගේ 'සාමාන්‍ය මනුෂ්‍ය හදවත' කෝලහාල කිරීමට පුළුවන් වුනත්, අපගේ විශ්වාසයේ හදවත තවතවත් දියුණුකර ගැනීමට එය අවස්ථාවක් බවට පත්කර ගනිමු.

මෙම වසංගත තත්වය තුල ලෝකයා මුහුණදෙන නොයෙකුත් දුෂ්කරතාවයන් සමඟ, තම ආත්මාර්ථකාමී හදවත ගැන පසුවිපරම් කරමින්, 'අන්‍යයන් ප්‍රථමයෙන්' ලෙසින් අන්‍යයන් ගැන සිතන හැඟීම තවතවත් දියුණුකර ගෙන, මේ අවස්ථාවේ අපට කළ හැකි  බෝධිසත්ව චර්යයාවේ යෙදීමට අධිෂ්ඨාන කරගනිමු. එයින් මිල කළ නොහැකි ආශිර්වාදය වන 'ඉමහත් වූ සතුටක්' ලැබෙන බවට සහතික වෙමි.



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: info@rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: dharmasa@rksabuddhistcenter.org
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhiln**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**